# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**2002 අංක 17 දරන මැනුම් පනතේ 41(2) හා 37(ඊ) වගන්ති අනුව ලියාපදිංචි මිනින්දෝරුවරයෙක්ට පළමුවරට වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා පවත්වනු ලබන විභාගය - 2025**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු මිනින්දෝරුවන් හැර, අනෙකුත් ලියාපදිංචි මිනින්දෝරුවන්ට වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් නිකුත් කිරීම සඳහාවන විභාගය දියතලාව, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ දී පවත්වනු ලැබේ.

02. මෙම විභාගය පහත දැක්වෙන අයුරින් කොටස් දෙකකින් සමන්විත වූ ප්‍රායෝගික පරීක්ෂණයකි. දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි අනුව විභාගය පැවැත්වෙන අතර මෙට්‍රික් ඒකක භාවිත කළ යුතු ය.

| | | |
|---|---|---|
| I වැනි කොටස | - | බිම් මැනීම (Land Surveying) සහ<br>මට්ටම් ගැනීම (Levelling)<br>(සාමාර්ථ ලකුණු මට්ටම - 60%) |
| II වැනි කොටස | - | පිඹුරු වැඩ (Plan Work )<br>(සාමාර්ථ ලකුණු මට්ටම - 60%) |

03. විෂය නිර්දේශය :

- මේ සඳහා පහත උපකරණ භාවිතය පිළිබඳ දැනුම-
  - දම්වැල (Chain)
  - පටිය (Tape)
  - ට්‍රිකෝණමානය
  - පූර්ණමානය
  - මට්ටම් ගැනීමේ උපකරණ
  - මිහිතැන් ගැන්වීම් සූ සැටි පද්ධති උපකරණය (GNSS)
- ඉඩම් මැනීම පිළිබඳ මූලික විමර්ෂනය, මහජන සම්බන්ධතා හා ආචාර ධර්ම, ඉඩම් මැනීමට අදාළ නීති රෙගුලාසි පිළිබඳ දැනුම, පිරික්සුම් සටහන් පිළියෙල කිරීම, උපකරණ ආරක්ෂාව හා පරිහරණය පිළිබඳ දැනුම
- මැනුම් පරික්‍රමණ, කුඤ්ඤ, මායිම් යෙදීම පිළිබඳ දැනුම
- ක්ෂේත්‍රය සටහන් තැබීම, ඛණ්ඩාංක පත්‍ර පිළියෙල කිරීම, දෝෂ බෙදා හැරීම
- පිඹුර සහ පරිමාණය ගැන අවබෝධය
- පැරණි පිඹුරු අධිස්ථාපනය
- Auto CAD, SD CAD, ZW CAD යන මෘදුකාංග ගැන අවබෝධය සහ පිඹුරක් පිළියෙල කිරීම.
- TLDB මෘදුකාංග භාවිතයෙන් ඉඩම් විස්තර ලැයිස්තු පිළියෙල කිරීම
- වර්ගඵල ආගණනය, මැනුම් වාර්තාව සහ ගොනුව පිළියෙල කිරීම
- මූලික පිල් ලකුණු, පිල් ලකුණු සහ මුහුදු මට්ටමේ සිට උස පිළිබඳ අවබෝධය
- මට්ටම් පොත් සටහන් කිරීම, මට්ටම් තුලනය කිරීම සහ සමෝච්ච රේඛා පිඹුරක් පිළියෙල කිරීම
- මිහිතැන් ගැන්වීම් සූසැටි පද්ධති (GNSS) පාලන ලක්ෂ්‍ය, SLCORSnet, Radio, RTK, GSM RTK, Network RTK පිළිබඳ දැනුම.

04. විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් :

පහත සඳහන් සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුයි.

i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මගින් ලබාගත් මැනුම් විද්‍යාවේදී/විද්‍යාවේදී උපාධි සහතිකය
ii. ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි සහතිකය

05. විභාග ගාස්තු :

විභාගයට ඇතුලත් වීම සඳහා කොළඹ 05, සර්වේයර් ජනරාල් කාර්යාලයේ සරප් වෙත, ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයක් වෙත හෝ දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වෙත හෝ Gov pay.lk වෙබ් අඩවිය මගින් හෝ රු. 20,000 ක මුදලක් ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පත සමග එවිය යුතුය. (රිසිට්පතෙහි ඡායා පිටපතක් ඉදිරි අවශ්‍යතාවය සඳහා ළඟ තබා ගත යුතුය) කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු නොගෙවනු ලබන අතර, මුදල් ඇණවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ. රිසිට්පතක් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :

(අ) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සෙ. මී. 21 x සෙ. මී. 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරන ලද අයදුම්පත්‍රයක් පහත දැක්වෙන ලිපිනයට 2025 අගෝස්තු මස 14 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී,
විභාග අංශය,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506,
කොළඹ 05

(ආ) කවරයේ වම්පස ඉහළ කෙලවරේ "වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා පවත්වනු ලබන විභාගය - 2025" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඇ) දෙන ලද ආදර්ශ අයදුම්පතට අනුකූලව පිළියෙල කර නොමැති අයදුම්පත් ද නිසි පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ද *ගැසට්* නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මෙම විභාගය පැවැත්වෙන දින හා වේලාවන් පිළිබඳව පසුව දැනුම් දෙනු ලැබේ.

08. සෑම අයදුම්කරුවෙකු ම නියම කරනු ලබන දිනයන් හි විභාගයට පෙනී සිටීම අනිවාර්ය වේ. මෙම අපේක්ෂකයින් විභාග පරීක්ෂකවරයා විසින් නියම කරන ලද වේලාවන් අතරතුර ක්ෂේත්‍රයේ වැඩ කළ යුතු අතර ඒ සඳහා ක්‍රියාකාරී තත්වයක ඇති ක්‍රමාංකනය කරන ලද, දෝෂ රහිත උපකරණ රැගෙන ආ යුතුයි. පරීක්ෂණ වේලාවන් තුළ දී අයදුම්කරුවන් වෙනත් කිසිවෙකුත් සමඟ කථා කිරීම හෝ ජංගම දුරකථන/තාක්ෂණික උපාංග භාවිත කිරීම නොකළ යුතුයි. එසේ කරන අයදුම්කරුවන් විභාගයට නුසුදුස්සන් සේ සළකනු ලැබේ. සෑම අපේක්ෂකයෙකු ම මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් පනවන නීති රීතිවලට යටත් විය යුතුයි.

වයි. ජී. ඥානතිලක,
සභාපති,
ඉඩම් මැනුම් සභාව.

2025 ජූලි මස 25 වැනි දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506,
කොළඹ 05.